**සාමාන්‍ය සමය දසසත්වන ඉරුදින** | **දේව ප්‍රකාශන** | 26-07-15

**පළමුවන දේව ප්‍රකාශනය** 2 රාජාවලිය 4:42-44

රාජාවලියේ දෙවන පොතෙන් උපුටා ගත් කොටසකි.

**("ඔව්හු එයින් අනුභව කොට ඉතිරි කරනු ඇත.")**

තවද බාල්-ෂාලිෂාහි සිට මනුෂ්‍යයෙක් ප්‍රථම අස්වැන්නෙන් යව රොටී විස්සක් ද අලුත් ගොයම් කරල් ද තමගේ මල්ලේ දමා ගෙන දෙවියන් වහන්සේට කැපවූ මනුෂ්‍යයා වෙත ගෙනාවේ ය. ඔහු ද, "සෙනඟට කන්න දෙන්නැ"යි කී ය. ඔහුගේ මෙහෙකරුවා, "කිමෙක්ද? මේවා මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙහි තබන්නදැ"යි ඇසී ය. එහෙත් ඔහු "ඒවා සෙනඟට කන්න දෙන්න. මන්ද, ඔවුන් අනුභව කොට ඉතිරි කරනු ඇත. කියා සමිඳුණන් වහන්සේ වදාරන සේකැ"යි පැවසී ය. එවිට ඔහු ඒවා ඔවුන් ඉදිරියෙහි තැබී ය. ඔව්හු එයින් අනුභව කොට සමිඳුණන් වහන්සේ වදාළ ලෙස ඉතිරි කළෝ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය** ගීතාවලිය 145:10-11, 15-18

පිළිතුර: සමිඳාණෝ ජීවමාන සියල්ලන්ගේ ආසාවන් සම්පූර්ණ කරන සේක.

ගීය: සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි; ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති. ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති. ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

සියල්ලන්ගේ දෙනෙත් ඇවිටිල්ලෙන් ඔබ දෙස යොමු කර තිබේ. ඔබ ද සුදුසු කාලයේ දී ඔවුන්ට ආහාර දෙන සේක. ඔබ සිය හස්තය විදහා පාන සේක; ජීවමාන සියල්ලන්ගේ ආසාවන් සපුරාලන සේක.

සමිඳාණෝ සැම අතින් ම සාධාරණ ය, එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය. අයැදින සියල්ලන්ට සමිඳාණෝ ළං ව සිටින සේක. අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින සේක.

**දෙවන දේව ප්‍රකාශනය** එපීසි 4:1-6

පාවුලු තුමන් විසින් එපීසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

(එක ම ශරීරය ය. එක ම ස්වාමින් වහන්සේ ය. එක ම ඇදහිල්ල ය. එක ම බව්තීස්ම-ස්නාපනය ය.)

එබැවින්, දෙවියන් වහන්සේගෙන් ඔබ ලත් කැඳවීමට ඔබින ලෙස හැසිරෙන මෙන් සමිඳුණන් වහන්සේ උදෙසා හිරකාරයෙකු වන මම ඔබෙන් උදක් ම ඉල්ලමි. සැම විට ම නිහතමානී ව, විනීත ව, ඉවසිලිවන්ත ව සිටින්න; ප්‍රේමයෙන් එකිනෙකා සමඟ පැහී සිටින්න; ආත්මයාණන් වහන්සේගෙන් වන එක්සත්කම, සමඟිකමේ බැම්මෙන් පවත්වාගන්ට උත්සාහ කරන්න. ඔබ කැඳවනු ලැබූ කල එක ම බලාපොරොත්තුවකට කැඳවනු ලැබූ ලෙස, ඇත්තේ එක ම ශරීරයත්, එක ම ආත්මයාණන් වහන්සේත් ය; එක ම සමිඳුණන් වහන්සේත්, එක ම ඇදහිල්ලත්, එක ම බව්තීස්ම-ස්නාපනයත් ය; සියල්ලන්ට ඉහළින් සිටින, සියල්ලන් තුළින් ක්‍රියා කරන, සියල්ලන් තුළ වැඩවසන එක ම දෙව් පියාණන් වහන්සේත් ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 7:16

ආලේලූයා! ආලේලූයා!
"ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටින්නේ ය.
දෙවියන් වහන්සේ සිය සෙනඟ ගළවන්න වැඩිය සේක."
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 6:1-15

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(එහි සිටි සියල්ලන්ට තෘප්තිමත් වන තරම් කෑම ලැබිණි.)**

ඉන්පසු ජේසුස් වහන්සේ ගලීල මුහුදෙන්, හෙවත් තිබේරියස් මුහුදෙන් එගොඩට වැඩම කළ සේක. උන් වහන්සේ රෝගීන් සුව කරමින් කළ හාස්කම් දුටු බැවින් මහා සමූහයක් උන් වහන්සේ පසුපස්සේ ගියහ. එවිට ජේසුස් වහන්සේ කන්දකට නැඟී තමන්ගේ ශ්‍රාවකයන් සමඟ එහි වැඩහුන් සේක. ජුදෙව්වරුන්ගේ මංගල්‍යය වූ පාස්කුව ළං ව තිබිණි. ජේසුස් වහන්සේ ඇස් ඔසවා බැලූ කල, තමන් ළඟට මහා සමූහයක් ඇදී එනු දැක, "මොවුන් හැම දෙනාට ම කන්නට දීමට අපි කොතැනින් රොටි මිලේට ගනිමු දැ"යි පිලිප්ගෙන් ඇසූ සේක. උන් වහන්සේ මෙසේ වදාළේ ඔහු පරීක්ෂා කරන පිණිස ය. මන්ද, තමන් කරන්න යන්නේ කුමක් දැ යි උන් වහන්සේ ම දැන සිටි බැවිනි. පිලිප් පිළිතුරු දෙමින්, "එකිනෙකාට ටික ටිකවත් දීමට රිදී කාසි දෙසියයක රොටි වුවත් නොසෑහේ ය"යි කී ය. ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙක් වූ සීමොන් පේදුරුගේ සොහොයුරු ඇන්ඩෘ උන් වහන්සේ අමතා, "යව රොටි පහක් ද මසුන් දෙදෙනකු ද ඇති කොලුවෙක් මෙහි සිටියි. එහෙත් මෙපමණ දෙනෙකුන්ට එයින් කුමන පලක් දැ"යි ඇසී ය. "මිනිසුන් හිඳුවන්නැ"යි ජේසුස් වහන්සේ වදාළ සේක. එතැන බොහෝ තණකොළ විය. ගණනින් පන්දහසක් පමණ පිරිමි එහි හිඳගත්හ. එවිට ජේසුස් වහන්සේ රොටි ගෙන තුති පුදා, හිඳගෙන සිටි අයට බෙදා දුන් සේක. එලෙස ම මසුන්ගෙන් ද දුන් සේක. සියල්ලන්ට කැමැති තරම් කෑම ලැබුණේ ය. ඔවුන් කා තෘප්තියට පැමිණි පසු, උන් වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා, "කිසිවක් නාස්ති නොවන ලෙස කැබලි එකතු කර ගන්නැ"යි වදාළ සේක. මෙසේ කෑම වැළඳූ අය, යව රොටි පහෙන් ඉතිරි කළ කැබලි එකතු කොට මලූ දොළසක් පුරවාගන්නා ලදී.

සමූහයා මේ හාස්කම දුටු කල "සැබෑවට ම මෙතුමාණෝ ලොවට වඩින්නට සිටින දිවැසිවරයාණෝ ය"යි කී හ. තමන් බලහත්කාරයෙන් අල්ලාගෙන, රජකමට පත් කරන්නට ඔවුන් සැරසෙන බව ජේසුස් වහන්සේ දැනගෙන, නැවත තනියම කන්දට වැඩිය සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.